# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/29 - 2012 ඔක්තෝබර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2012.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : සීඑස්ජ්/1/16/1.

නිවේදනය

1681/2 හා 2010 නොවැම්බර් මස 22 දිනැති *අති විශෙෂ* ගැසට් පත්‍රයේ පළකරන නිවේදනයෙන් ප්‍රකාශයට පත්කර ඇති පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(1)(ආ) ව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කරමින් අතිගරු ජනාධිපතිතුමා විසින් ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය ධූරයට පත්කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු එස්. එම්. චන්ද්‍රසේන මැතිතුමා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 47(ආ) ව්‍යවස්ථාව යටතේ සිය අමාත්‍ය ධූරයෙන් 2012 සැප්තැම්බර් මස 26 වැනි දින සිට ඉල්ලා අස්වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

2012 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.